# අයවැය පොරොන්දු:

# මැති සබයෙන් ඔබ්බට

2019 වසර අවසානයේ තක්සේරුව

2021

© Verité Research

Verité Research
Strategic Analysis for Asia

## පටුන


අයවැය පොරොන්දු: මැති සබයෙන් ඔබ්බට ........ 3

ඇගයීම් ක්‍රමවේදය ........ 3

**1**.වියදම් යෝජනා ........ 4

1.1. විවෘතභාවය ඇගයීම ........ 4

1.2. රජයේ ආයතනවල විවෘතභාවය ශ්‍රේණිගත කිරීම ........ 5

**තොරතුරු ලබා ගැනීමේ පහසුව:** ........ 5

1.3. ප්‍රගතිය මැනීම ........ 5

2. ප්‍රතිපත්ති යෝජනා ........ 7

2.1. ප්‍රගතිය මැනීම ........ 7

3. ප්‍රගතිය, විවෘතභාවය සහ ශ්‍රේණිගත කිරීමේ තක්සේරු පිළිබඳ විස්තර. ........ 8

## අයවැය පොරොන්දු: මැති සබයෙන් ඔබ්බට

2017 වසරේ අරඹන ලද "අයවැය පොරොන්දු: මැති සබයෙන් ඔබ්බට" වාර්ෂිකව අයවැය කතාවෙහි සඳහන් පොරොන්දු ඉටුකිරීමෙහිලා රජයේ කාර්ය සාධනය වාර්තා කරන publicfinance.lk යටතේ ඇති ඩැෂ්බෝර්ඩයක් වේ

ආණ්ඩුව ඉදිරිපත් කරන වාර්ෂික අයවැය කතාවෙහි අයවැය පොරොන්දු පිළිබඳ මූලික ප්‍රශ්න දෙකකට පිළිතුරු සෙවීම මෙම ඩැෂ්බෝර්ඩය මූලික අරමුණ වේ.

- (i) රජය ක්‍රියාවට නංවන්නේ පවසන දෙය ද?
- (ii) රජය පවසන්නේ ක්‍රියාවට නංවන දෙය ද?

මෙම ඩැෂ්බෝර්ඩය හරහා ඉහත ප්‍රශ්න වලට පිළිතුරු ජනතාවට ලබා දීමෙහි අරමුණ වන්නේ,

- (i) රජයේ අයවැය පොරොන්දු සම්බන්ධව විවෘතභාවය වර්ධනය කිරීම සහ
- (ii) අයවැය පොරොන්දු ඉටුකිරීම සම්බන්ධව රාජ්‍ය ආයතනවල වගවීම වර්ධනය කිරීමයි

## ඇගයීම් ක්‍රමවේදය

අයවැය කතාවේ සඳහන් රුපියල් මිලියන 500කට වඩා වැඩි නව වැය යෝජනා හෙවත් පොරොන්දු වෙනුවෙන් වෙන්කළ ප්‍රතිපාදනවල ප්‍රගතිය මෙම ඩැෂ්බෝර්ඩය මගින් විමසා බැලේ. මෙම යෝජනා අයවැය ලේඛනයෙහි 2 වන ඇමුණුමෙහි සඳහන් වේ. 2019 දී මෙම වේදිකාව ප්‍රතිපාදන වෙන් කිරීමක් නොමැති, නීති සහ රෙගුලාසි වල වෙනස්කම් වැනි ප්‍රතිපත්ති යෝජනා විමසා බැලීම ආරම්භ කරන ලදී.

| වසර | තෝරාගත් වියදම් යෝජනා | | | තෝරාගත් ප්‍රතිපත්ති යෝජනා |
|---|---|---|---|---|
| | තෝරා ගැනීමේ සීමාව[1] | යෝජනා ගණන | යෝජනා වල මුළු වටිනාකම | යෝජනා ගණන |
| 2017 | රු. බිලියන 1ට වැඩි | 37 | රු. මිලියන 116,910 | කිසිවක් නැත |
| 2018 | රු. බිලියන 1ට වැඩි | 38 | රු. මිලියන 149,350 | කිසිවක් නැත |
| 2019 | රු. මිලියන 500 ට වැඩි | 37 | රු. මිලියන 100,875 | 22 |

වසරකට දෙවතාවක් යාවත්කාලීන කරන මෙම වේදිකාව නව වියදම් විවෘතභාවය සහ ප්‍රගතිය යන දර්ශක දෙකක් යටතේ ඇගයීමට ලක් කරයි.ප්‍රතිපත්ති යෝජනා ක්‍රියාත්මක කිරීම තනි ප්‍රගති දර්ශකයක් භාවිතයෙන් නිරීක්ෂණය කරනු ලැබේ. ප්‍රතිපත්ති යෝජනා වල තත්වය ප්‍රධාන වශයෙන් ඇගයීමට ලක් කරනු ලැබුවේ ප්‍රසිද්ධියේ ලබා ගත හැකි

[1] 2017 සහ 2018 දී තෝරා ගැනීමේ සීමාව පදනම් වූයේ යෝජනා සඳහා යෝජිත වියදම් වෙන් කිරීම මත පමණි. අයවැය කථාවේ වාර්තාකරණ ආකෘතියේ වෙනසක් හේතුවෙන් 2019 දී තෝරා ගැනීමේ සීමාව පදනම් වූයේ යෝජිත ප්‍රතිපාදන යෝජනාව සහ එයට දැනටමත් වෙන් කර ඇති මුදල එකතු කිරීම මත ය.

තොරතුරු හරහා වන අතර තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ ගොනු කරන ලද ඉල්ලීම් මත රැඳී සිටීමෙන් නොවේ. එබැවින් ප්‍රතිපත්ති යෝජනා ඇගයීමට ලක් කිරීමේදී විවෘතභාවය පිළිබඳ දර්ශකයක් නොමැත.

ආණ්ඩුවේ අර්ධ වාර්ෂික කාර්ය සාධනය එම වසරේ ඔක්තොබර් මස තුළදීද, සමස්ථ වාර්ෂික කාර්ය සාධනය ඊළඟ වසරේ අප්‍රේල්/ මැයි මස තුළදීද එළි දක්වයි. [2]

# 1.වියදම් යෝජනා

## 1.1. විවෘතභාවය ඇගයීම

මෙම දර්ශකය, අයවැය යෝජනා සම්බන්ධයෙන්, රජය පවසන්නේ ක්‍රියාවට නංවන දෙයද යන්න අධ්‍යයනය කෙරේ. මෙහි දී අගයීමට ලක් කරන්නේ අයවැය පොරොන්දු වල ප්‍රගතිය පිළිබඳ තොරතුරු කොපමණ දුරට රජය හෙළිදරව් කරන්නෙද යන්නයි. මේ සඳහා අවශ්‍ය අයවැය පොරොන්දුවලට අදාළ තොරතුරු අදාළ රාජ්‍ය ආයතනයේ වෙබ් අඩවි පරීක්ෂා කිරීම සහ තොරතුරු දැනගැනීමේ පණත (RTI) යටතේ රාජ්‍ය ආයතන වෙත තොරතුරු ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීම මගින් රැස්කර ඇත. 2017 සහ 2018 වර්ෂවලදී රජයේ ආයතන වෙත ගොස් සහ එම ආයතන වෙත අවිධිමත් ඉල්ලීම් කර ද තොරතුරු රැස් කරන ලදී. කෙසේ වෙතත්, එම තොරතුරු රැස් කිරීමේ ක්‍රමය මේ වනවිට අත්හිටුවා ඇත.

අර්ධ වාර්ෂික ඇගයීමේදී, වසරේ පළමු මාස හය තුළ අයවැය පොරොන්දු ප්‍රගතිය සම්බන්ධයෙන් තොරතුරු හෙළි කිරීම අගයන අතර, වසර අවසානයේ ප්‍රගතිය සම්බන්ධයෙන් තොරතුරු හෙළි කිරීම සමස්ත වසර අවසානයේදී ඇගයීමට ලක් කරයි.

ඇගයීම කරන අවස්ථාවේ දී ලබා ගත හැකි තොරතුරු මත පදනම්ව විවෘතභාවය පහත පරිදි වර්ගීකරණය කර ඇත.

**ආවෘත-** සමස්ථ වසර තුල ප්‍රගතිය ඇගයීමට අවශ්‍ය කිසිදු තොරතුරක් නැත

**සීමිත-** තිබෙන තොරතුරු සමස්ථ වසර තුල ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නැත

**උදාසීන-** ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබාගැනීමට සහ/හෝ ලබා දුන් තොරතුරු භාවිතා කරමින් ප්‍රගතිය ඇගයීමට දැඩි පරිශ්‍රමයක් දැරීමට සිදුවිය

**සාධනීය-** අයවැය පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු අදාළ කාලය තුළ ඉල්ලුම් කිරීමෙන් ලබාගත හැකිය

**විවෘත-** පොරොන්දුවේ සමස්ථ ප්‍රගතිය පිළිබඳ තොරතුරු ප්‍රගාමීව හෙළිදරව් කර ඇත

---

[2] 2019 අයවැය කථාව ප්‍රමාද වී 2019 මාර්තු මාසයේදී පමණක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ බැවින් 2019 දී වසර අවසානයේ ඇගයීම පමණක් සිදු කරන ලදී.

## 1.2. රජයේ ආයතනවල විවෘතභාවය ශ්‍රේණිගත කිරීම

ඒ ඒ රාජ්‍ය ආයතනය තමන් ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින පොරොන්දු පිළබඳ තොරතුරු හෙළිදරව් කිරීම මත පදනම්ව එම ආයතනවල විවෘතභාවය පිළිබඳ සංසන්දනාත්මක ශ්‍රේණිගත කිරීමක් මෙමගින් සපයයි. සෑම ආයතනයකටම 0 සිට 100 දක්වා ලකුණු ලැබෙනු ඇති අතර ඉහළම ලකුණු මට්ටම පෙන්නුම් කරන්නේ ලකුණු 100 කින්ය. අනතුරුව, වර්ෂය තුළ ඔවුන්ගේ සාපේක්ෂ ක්‍රියාකාරිත්වය පෙන්නුම් කරමින්, වැඩිම ලකුණු ගත් ආයතනයේ සිට අඩුම ලකුණු ගත ආයතනය දක්වා රාජ්‍ය ආයතන ඉහළ සිට පහළට ශ්‍රේණිගත කරනු ලැබේ.

රාජ්‍ය ආයතනය සඳහා වන සමස්ත ලකුණු ගණනය කරනු ලබන්නේ එම ආයතනයේ විෂය පථයට අයත් එක් එක් පොරොන්දුවේ ලකුණු වල බරිත සාමාන්‍යක් ලෙස ය. සෑම පොරොන්දුවක්ම 0 සිට 100 දක්වා පරාසයක් තුල ඇගයීමට ලක් කෙරේ. සෑම පොරොන්දුවක් සඳහාම ලකුණු ගණනය කරන (i) පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමේදී ලද තොරතුරු කොපමණ දුරට ප්‍රයෝජනවත්ද සහ (ii) කොතරම් පහසුවෙන් එම තොරතුරු ලබා ගත හැකි වූවාද යන කරුණු දෙක මත ය.

තොරතුරු භාවිතයට සුදුසු වීම/ භාවිතා කිරීමේ හැකියාව: ලබා ගත් තොරතුරු, සම්පුර්ණයෙන් ප්‍රයෝජනයට ගත හැකි, අර්ධ වශයෙන් ප්‍රයෝජනයට ගත හැකි සහ කිසිසේත්ම ප්‍රයජෝනයට ගත නොහැකි යනුවෙන් ඛාණ්ඩ තුනකට වර්ග කර, පිළිවෙලින් 100, 50 සහ 0 වශයෙන් ලකුණු ලබා දෙන ලදී.

### තොරතුරු ලබා ගැනීමේ පහසුව:

ලබාගත් තොරතුරු වල ප්‍රයෝජනවත්බව අනුව ලබා දුන් ලකුණු, එම තොරතුරු ලබා ගැනීමේ පහසුව අනුව නැවත සකස් කරනු ලැබේ. මෙහිදී තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉල්ලුම් කිරීමෙන් තොරතුරු ලබා ගැනීමේ හැකියාවට සාපේක්ෂව අන්තර්ජාලය හරහා ඉල්ලුම් කිරීමකින් තොරව තොරතුරු ලබා ගැනීමේ හැකියාවට වැඩි ලකුණු හිමි වෙයි.




## 1.3. ප්‍රගතිය මැනීම

මේ දර්ශකය යටතේ රජය තමන් සිදු කරන බව පැවසූ ක්‍රියාකාරකම් කෙතරම් දුරකට ඉටු කර ඇත්ද යන්න විමසා බැලේ. එනම් මෙහිදී පොරොන්දු ඉටු කිරීමේ ප්‍රගතිය ඇගයීමට ලක්කරයි. මෙම ඇගයීම කරන්නේ පොරොන්දුව

ඉටුකිරීමට වගකිව යුතු රාජ්‍ය ආයතනය විසින්ම ප්‍රකාශයට පත් කරන ලද කාලසීමාවන් හා ඉලක්ක පදනම් කරගෙනය.

අයවැය පොරොන්දු වල *අර්ධ වාර්ෂික ප්‍රගතිය* පහත පරිදි වර්ගීකරණය කර ඇත.

**හෙළිකර නැත-** ප්‍රගතිය ඇගයීමට කිසිදු තොරතුරක් නැත. නැතහොත් පවත්නා තොරතුරු ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නැත

**අතහැර දමා ඇත-** මෙම පොරොන්දුව තක්සේරු කිරීමේ වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර නොමැත

**නොසලකා හැර ඇත-** මෙම පොරොන්දුව ක්‍රියාවට නැංවීමට සැලසුම් කර ඇතත් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර නැත

**මන්දගාමී ප්‍රගතියක් ඇත-** මෙම පොරොන්දුව ක්‍රියාවට නංවා ඇතිමුත් නියමිත කාලයට කටයුතු සිදු කිරීමට අසමත් වී ඇත

**සතුටුදායක ප්‍රගතියක් ඇත-** මෙම පොරොන්දුව ක්‍රියාවට නංවා ඇති අතර අදාළ ඉලක්කය අත්පත් කරගෙන හෝ ඉලක්කය අභිබවා ගොස් ඇත[3]

අයවැය පොරොන්දු වල *වාර්ෂික ප්‍රගතිය* පහත පරිදි වර්ගීකරණය කර ඇත.

**හෙළිකර නැත-** ප්‍රගතිය ඇගයීමට කිසිදු තොරතුරක් නැත. නැතහොත් පවත්නා තොරතුරු ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නැත/ ප්‍රයෝජනයට ගත නොහැක.

**අතහැර දමා ඇත-** වසරේ ක්‍රියාකාරී සැලසුමෙන් ඉවත්කර හෝ වසර තුල කිසිදු ප්‍රගතියක් වාර්තා කර නොමැත

**දුර්වලයි-** ඉලක්කගත ප්‍රගතියෙන් 33% වඩා අඩු ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.

**අර්ධසම්පූර්ණයි-** ඉලක්කගත ප්‍රගතියෙන් 33%-66% අතර ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.

**සෑළකිය යුතුයි-** ඉලක්කගත ප්‍රගතියෙන් 66%-80% ත් අතර ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.

**සම්පුර්ණයි-** ඉලක්කගත ප්‍රගතියෙන් 80% ඉක්මවූ ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත

---

[3] අයවැය පොරොන්දුවක් සතුටුදායක ප්‍රගතියක් ලබාඇති බවට වර්ගීකරණය කෙරෙනුයේ ජුනි 30වන දින වන විට අයවැය වර්ෂයේ ඉලක්ක වලින් 90% ක් වත් අදාළ කාලය තුළ නිම කර ඇත්නම් පමණි.

## 2. ප්‍රතිපත්ති යෝජනා

2019 දී BudgetPromises.Org විසින් අයවැය කථාවේදී රජය විසින් කරන ලද ප්‍රතිපත්තිමය කැපවීම්වල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා සිය විෂය පථය පුළුල් කළේය. මෙම යෝජනා සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමක් නොමැත.

ව්‍යවස්ථාදායක/ නීතිකාරක/ නීති සම්පාදක පැනවීමක් හෝ නියාමන දැනුම්දීම් (ගැසට්) "ක්‍රියාත්මක කර ඇත" හෝ "අර්ධ වශයෙන් ක්‍රියාත්මක කර ඇත" ලෙස සැලකීමට අවශ්‍යතාවය මත මෙම යෝජනා තෝරා ගන්නා ලදී. පොදුවේ ලබා ගත හැකි ගැසට් නිවේදන, රජයේ චක්‍රලේඛ, රජයේ තොරතුරු දෙපාර්තමේන්තුවේ කැබිනට් තීරණ පිළිබඳ නිවේදන වලින් තොරතුරු ලබා ගන්නා ලදී. ප්‍රතිපත්තිය පිළිබඳ පොදු තොරතුරු නොමැති විට, ලිපි, දුරකථන ඇමතුම් සහ විද්‍යුත් තැපැල් මගින් තොරතුරු සඳහා අමාත්‍යාංශහට සෘජුවම සම්බන්ධ විය.

### 2.1. ප්‍රගතිය මැනීම

අයවැය කථාවේ හඳුන්වා දී ඇති ප්‍රතිපත්ති යෝජනා ක්‍රියාත්මක කිරීමේදී රජය ලබා ඇති ප්‍රගතිය මෙමගින් විමසා බැලේ.

**හෙළිකර නැත-** ප්‍රගතිය ඇගයීමට කිසිදු තොරතුරක් නැත. නැතහොත් පවත්නා තොරතුරු ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නැත.

**ක්‍රියාත්මක කර නැත-** යෝජනාවේ කිසිදු කොටසක් සඳහා අවශ්‍ය ව්‍යවස්ථාදායක/ නීතිකාරක/ නීති සම්පාදක පැනවීමක් හෝ නියාමන දැනුම්දීම් (ගැසට්) ප්‍රකාශයට පත් කර නොමැත. අදාළ අමාත්‍යාංශය / රජයේ ආයතනය විසින් මෙය ලිඛිතව සනාථ කර ඇත.

**අර්ධ වශයෙන් ක්‍රියාත්මක කර ඇත-** යෝජනාවේ සියලුම කොටස් සඳහා නොව සමහර කොටස් සඳහා අවශ්‍ය ව්‍යවස්ථාදායක/ නීතිකාරක/ නීති සම්පාදක පැනවීමක් හෝ නියාමන දැනුම්දීම් (ගැසට්) ප්‍රකාශයට පත් කර ඇත.

**සම්පූර්ණව ක්‍රියාත්මක කර ඇත-** ප්‍රතිපත්ති යෝජනාව සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර ඇත. යෝජනාවේ සම්පූර්ණ විෂය පථය සඳහා අවශ්‍ය ව්‍යවස්ථාදායක/ නීතිකාරක/ නීති සම්පාදක පැනවීමක් හෝ නියාමන නිවේදනය (ගැසට් පත්‍රය) ප්‍රකාශයට පත් කර ඇති අතර වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවේ.

## 3. ප්‍රගතිය, විවෘතභාවය සහ ශ්‍රේණිගත කිරීමේ තක්සේරු පිළිබඳ විස්තර.

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| "නංවමු ලංකා" ක්ෂුද්‍ර සහ කුඩා ව්‍යවසාය සංවර්ධන වැඩසටහන | ආවෘත | හෙළිකර නැත | කර්මාන්ත සහ සැපයුම් කළමනාකරණ අමාත්‍යාංශය-12 |
| | මෙම පොරොන්දුවට අදාළ තොරතුරු ලබාගැනීමට වගකිවයුතු රාජ්‍ය ආයතනය වෙත ඉදිරිපත් කළ 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ තොරතුරු ඉල්ලීමට මෙම අදාළ රාජ්‍ය ආයතනය තොරතුරු ලබා නොදුන් අතර මෙම පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමට භාවිත කළ හැකි කිසිදු තොරතුරක් වගකිවයුතු ආයතනයේ වෙබ් අඩවියේ පළකර නැත. | පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමට තොරතුරු නැත. | කර්මාන්ත සහ සැපයුම් කළමනාකරණ අමාත්‍යාංශය, 2019 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 16 න් අන්තිම ස්ථානයට පත් වූ රාජ්‍ය ආයතන පහෙන් එකකි. අමාත්‍යාංශයට ලැබුණු බරිත සාමාන්‍ය ලකුණු 0 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (වෙන් කළ ප්‍රතිපාදනය මත පදනම්ව බරිත සාමාන්‍යය). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2019 දී ඇගයීමට ලක් කරන ලද වැය යෝජනා 3 ක් පිළිබඳ තොරතුරු අනාවරණය කිරීම මත ය. |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| පාසැල් ළමුන් සඳහා නොමිලේ කිරි වීදුරුවක් ලබා දීම | උදාසීන | සම්පූර්ණයි | අධ්‍යාපන අමාත්‍යාංශය-7 |
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ අදාළ ආයතනය/ වගකිවයුතු රාජ්‍ය ආයතනය වෙත ඉදිරිපත් කළ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් සපයන ලද ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. කෙසේ වෙතත්, ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රගති තොරතුරු ස්ථාවර වාර්තාකරණ රාමුවක් භාවිතා නොකරන අතර පහසුවෙන් සැසඳිය නොහැකි බැවින් තොරතුරු ඇගයීමට සැලකිය යුතු උත්සාහයක් අවශ්‍ය විය. | ලද තොරතුරු අනුව, 2019 දෙසැම්බර් 31 වන දින වන විට 2019 සඳහා ඉලක්ක ගත ප්‍රගතියෙන් 86% ක් අත්කරගෙන ඇත. ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රගති වාර්තා, ස්ථාවර වාර්තාකරණ ආකෘතීන් භාවිතා නොකළේය. ක්‍රියාකාරී සැලැස්ම මඟින් ප්‍රතිලාභීන් 400,000 ක ඉලක්කයක් සටහන් කළ නමුත් මෙය දෛනික, සතිපතා හෝ මාසික ඉලක්කයක් දැයි නිශ්චිතව දක්වා නැත. තවද, මෙම යෝජනාව වසරේ දෙවන කාර්තුවේදී ආරම්භ වන බව එහි දැක්වේ. ප්‍රගති වාර්තාව 2019 ජනවාරි සිට දෙසැම්බර් දක්වා සතිපතා ප්‍රතිලාභීන් සංඛ්‍යාව ප්‍රකාශ කර ඇත. අපේක්ෂිත ප්‍රතිලාභීන්ගේ ප්‍රතිශතයක් ලෙස (එනම් 400,000) 2019 මාර්තු සිට දෙසැම්බර් දක්වා කාලය තුළ සාමාන්‍ය සතිපතා ප්‍රතිලාභීන් සංඛ්‍යාව භාවිතා කරමින් ප්‍රගතිය ගණනය කරන ලදී. ක්‍රියාකාරී සැලැස්ම පෙන්නුම් කරන්නේ ව්‍යාපෘතියේ වැඩ දෙවන කාර්තුවේදී ආරම්භ වන බවය. එබැවින් ප්‍රගති තක්සේරුව සඳහා සලකා බලනු ලැබුවේ අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා ප්‍රගති තොරතුරු පමණක්ය. | "2019 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 16 න් 7 වන ස්ථානයට අධ්‍යාපන අමාත්‍යාංශය පත්විය. අමාත්‍යාංශයට ලැබුණු බරිත සාමාන්‍ය ලකුණු 62.5 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (වෙන් කළ ප්‍රතිපාදනය මත පදනම්ව බරිත සාමාන්‍යය). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2019 දී ඇගයීමට ලක් කරන ලද එක් අයවැය යෝජනාවක්/ යෝජනාවක් පිළිබඳ තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| සනීපාරක්ෂක පහසුකම් නොමැති පුද්ගලයින්ට එම පහසුකම් ලබා දීම | ආවෘත | හෙළිකර නැත | නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශය-8 |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ තොරතුරු ඉල්ලුම් කලද, කිසිදු තොරතුරක් නොලැබිණි. තොරතුරු ඉල්ලුම්පත 2020 මාර්තු 12 වන දින අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී. කොරෝනා වෛරස උවදුරද සලකා බලමින්, 2020 මාර්තු 16 සිට මැයි 10 දක්වා කාලය මග හැර, තොරතුරු ලබා දීමට පනත අනුව බැඳී තිබෙන කාල සීමාව ගණනය කරන ලදී. එහෙත්, අදාළ කාල සීමාව තුල තොරතුරු නොලැබුණි. කිසිදු තොරතුරක් අදාළ ආයතනයේ වෙබ් අඩවිය පරික්ෂා කිරීමෙන්ද ලබා ගත නොහැකි විය. | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අන්තර්ජාලය හරහා ලබා දී ඇති තොරතුරු වලට අනුව, 2019 සැප්තැම්බර් 30 වන විට ප්‍රගතිය 2019 සඳහා ඉලක්ක කර ඇති ඉලක්කයෙන් 100% ක් විය. සම්පූර්ණ වර්ෂයට අදාළ තොරතුරු නොමැති බැවින්, මෙම තොරතුරු භාවිතා කරමින් ප්‍රගතිය ඇගයීමට ලක් කර ඇත. | 2019 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 16 න් 8 වන ස්ථානයට නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශය පත්විය. අමාත්‍යාංශයට ලැබුණු බරිත සාමාන්‍ය ලකුණු 61.3 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (වෙන් කළ ප්‍රතිපාදනය මත පදනම්ව බරිත සාමාන්‍යය). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2019 දී ඇගයීමට ලක් කරන ලද අයවැය යෝජනා/ යෝජනා 7 ක් පිළිබඳ තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| බස් නැවතුම්පළ සහ දුම්රිය ස්ථානවල සනීපාරක්ෂක | සීමිත | සම්පූර්ණයි | නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශය- 8 |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| පහසුකම් වැඩිදියුණු කිරීම | 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ තොරතුරු ඉල්ලුම් කලද, කිසිදු තොරතුරක් නොලැබිණි. තොරතුරු ඉල්ලුම්පත 2020 මාර්තු 12 වන දින අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී. කොරෝනා වෛරස උවදුරද සලකා බලමින්, 2020 මාර්තු 16 සිට මැයි 10 දක්වා කාලය මග හැර, තොරතුරු ලබා දීමට පනත අනුව බැඳී තිබෙන කාල සීමාව ගණනය කරන ලදී. එහෙත්, අදාළ කාල සීමාව තුල තොරතුරු නොලැබුණි. 2019 සැප්තැම්බර් 30 දක්වා ප්‍රගතිය පිළිබඳ තොරතුරු, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් ලබා දී ඇති "විශාල හා මහ පරිමාණ සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් වල ප්‍රගතිය - 2019 සැප්තැම්බර් 30" වාර්තාවෙන් ලබා ගත්තේය. | පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමට තොරතුරු නැත. | 2019 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 16 න් 8 වන ස්ථානයට නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශය පත්විය. අමාත්‍යාංශයට ලැබුණු බරිත සාමාන්‍ය ලකුණු 61.3 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (වෙන් කළ ප්‍රතිපාදනය මත පදනම්ව බරිත සාමාන්‍යය). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2019 දී ඇගයීමට ලක් කරන ලද අයවැය යෝජනා/ යෝජනා 7 ක් පිළිබඳ තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල ගඩොල් සහ සිමෙන්ති බදාමයෙන් බැඳි නිවාස ව්‍යාපෘතිය | සාධනීය | සම්පූර්ණයි | **ප්‍රජා සවිබලගැන්වීම් සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය-9** |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ අදාළ ආයතනය/ වගකිවයුතු රාජ්‍ය ආයතනය වෙත ඉදිරිපත් කළ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් සපයන ලද ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් යෝජනා සඳහා වෙනම ඉල්ලීම් දෙකක් ගොනු කරන ලදී. ලැබුනු එක් ප්‍රතිචාරයේ යෝජනා දෙකෙහිම ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් තොරතුරු අඩංගු විය. එබැවින්, යෝජනා දෙකෙහිම විවෘතභාවය ඇගයීම සඳහා මෙම ප්‍රතිචාරය සලකා බලනු ලැබීය. | ලද තොරතුරු අනුව, 2019 දෙසැම්බර් 31 වන දින වන විට 2019 සඳහා ඉලක්ක ගත ප්‍රගතියෙන් 91% ක් අත්කරගෙන ඇත. ප්‍රගතිය තක්සේරු කරන ලද්දේ ප්‍රගති වාර්තාවට අනුව නිවාස ඒකක ගණන සහ ඒවා නිම කිරීමට ඇති ආසන්නම මට්ටම යොදා ගනිමින් බරිත සාමාන්‍ය සම්පූර්ණ ප්‍රතිශතය ගණනය කිරීමෙන්ය. | 2019 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 16 න් 9 වන ස්ථානයට ප්‍රජා සවිබලගැන්වීම් සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය පත්විය. අමාත්‍යාංශයට ලැබුණු බරිත සාමාන්‍ය ලකුණු 55.9 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (වෙන් කළ ප්‍රතිපාදනය මත පදනම්ව බරිත සාමාන්‍යය). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2019 දී ඇගයීමට ලක් කරන ලද වැය යෝජනා 3 ක් පිළිබඳ තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| කන්කසන්තුරේ, නැගෙනහිර මාන්තායි, පරන්තන්, කොන්ඩච්චි, කින්නියා, | ආවෘත | හෙළිකර නැත | කර්මාන්ත සහ සැපයුම් කළමනාකරණ අමාත්‍යාංශය-12 |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| සමන්තුරේ සහ ත්‍රිකුණාමලයේ කාර්මික කළාප ඇති කිරීම | මෙම පොරොන්දුවට අදාළ තොරතුරු ලබාගැනීමට වගකිවයුතු රාජ්‍ය ආයතනය වෙත ඉදිරිපත් කළ 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ තොරතුරු ඉල්ලීමට මෙම අදාළ රාජ්‍ය ආයතනය තොරතුරු ලබා නොදුන් අතර මෙම පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමට භාවිත කළ හැකි කිසිදු තොරතුරක් වගකිවයුතු ආයතනයේ වෙබ් අඩවියේ පළකර නැත. | පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමට තොරතුරු නැත. | කර්මාන්ත සහ සැපයුම් කළමනාකරණ අමාත්‍යාංශය, 2019 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 16 න් අන්තිම ස්ථානයට පත් වූ රාජ්‍ය ආයතන පහෙන් එකකි. අමාත්‍යාංශයට ලැබුණු බරිත සාමාන්‍ය ලකුණු 0 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (වෙන් කළ ප්‍රතිපාදනය මත පදනම්ව බරිත සාමාන්‍යය). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2019 දී ඇගයීමට ලක් කරන ලද වැය යෝජනා 3 ක් පිළිබඳ තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| කුලියාපිටිය හා රත්නපුර රෝහල්වල මහාචාර්ය ඒකක ස්ථාපිත කිරීම. රුහුණු විශ්ව විද්‍යාලයේ සම සෞඛ්‍ය පීඨය සහ ශ්‍රී | සීමිත | සැළකිය යුතුයි | උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යාංශය-10 |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පර්යේෂණාගාර පහසුකම් සංවර්ධනය කිරීම. | 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනය වෙත ඉදිරිපත් කළ තොරතුරු ඉල්ලුම්පතකට ප්‍රතිචාර වශයෙන් ලැබුණු තොරතුරු ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නොවීය. ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් ලබා දී ඇති “විශාල හා මහ පරිමාණ සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් වල ප්‍රගතිය - 2018 සැප්තැම්බර් 30" මඟින් ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබා ගත්තේය. | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අන්තර්ජාලය හරහා ලබා දී ඇති තොරතුරු වලට අනුව, 2019 සැප්තැම්බර් 30 වන විට ප්‍රගතිය 2019 තුන්වන කාර්තුව සඳහා ඉලක්ක කර ඇති ඉලක්කයෙන් 75% ක් විය. ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගති මට්ටම ද 75% ක් ලෙස දක්වා ඇත. සම්පූර්ණ වර්ෂයට අදාළ තොරතුරු නොමැති බැවින්, මෙම තොරතුරු භාවිතා කරමින් ප්‍රගතිය ඇගයීමට ලක් කර ඇත. | "2019 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 16 න් 10 වන ස්ථානයට උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යාංශය පත්විය. අමාත්‍යාංශයට ලැබුණු බරිත සාමාන්‍ය ලකුණු 37.5 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (වෙන් කළ ප්‍රතිපාදනය මත පදනම්ව බරිත සාමාන්‍යය). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2019 දී ඇගයීමට ලක් කරන ලද එක් වැය යෝජනාවක් පිළිබඳ තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| සුබිතපුරවර” නගර සංවර්ධන වැඩසටහන | විවෘත | සැළකිය යුතුයි | නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශය- 8 |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු වගකිවයුතු අමාත්‍යංශයේ වෙබ් අඩවියේ ඇති ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනය වෙත ඉදිරිපත් කළ තොරතුරු ඉල්ලුම්පතට ලැබුණු ප්‍රතිචාරයද මාර්ගගත තොරතුරු මූලාශ්‍රය වෙත අපව යොමු කළේය. | ලද තොරතුරු අනුව, 2019 දෙසැම්බර් 31 වන දින වන විට 2019 සඳහා ඉලක්ක ගත ප්‍රගතියෙන් 79% ක් අත්කරගෙන ඇත. ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාවේ දක්වා ඇති මුළු ප්‍රතිපාදන හා ක්‍රියාකාරකම් නොගැලපුණි, එනම් රුපියල් මිලියන 200 කට ගණනය වන ක්‍රියාකාරකම්, ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් වුවද ප්‍රගති වාර්තාවේ සඳහන් නොවීය. මෙම ක්‍රියාකාරකම් 100% ක් සම්පූර්ණ කර ඇතැයි උපකල්පනය කරන ලදී. ඉතිරි කටයුතු වල අවසන් කිරීමේ මට්ටම ප්‍රගති වාර්තාවට අනුව ගනු ලැබීය. යෝජනාවේ සමස්ත ප්‍රගතිය සියලු ක්‍රියාකාරකම්වල ප්‍රගතියේ බර තැබූ සාමාන්‍යයක් ලෙස ගණනය කරන ලදී. බර තැබීම එක් එක් ක්‍රියාකාරකම් සඳහා වියදම් වෙන් කිරීමේ පදනම මත විය. යෝජනාවේ සමස්ත ප්‍රගතිය සියලු ක්‍රියාකාරකම්වල ප්‍රගතියේ බරිත සාමාන්‍යයක් ලෙස ගණනය කරන ලදී. බරලැම එක් එක් ක්‍රියාකාරකම් සඳහා වියදම් වෙන් කිරීමේ පදනම මත විය. | 2019 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 16 න් 8 වන ස්ථානයට නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යංශය පත්විය. අමාත්‍යාංශයට ලැබුණු බරිත සාමාන්‍ය ලකුණු 61.3 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (වෙන් කළ ප්‍රතිපාදනය මත පදනම්ව බරිත සාමාන්‍යය). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2019 දී ඇගයීමට ලක් කරන ලද අයවැය යෝජනා/ යෝජනා 7 ක් පිළිබඳ තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| | ආවෘත | හෙළිකර නැත | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| කල්මුණේ සහ සමන්තුරේ නගර සංවර්ධන ව්‍යාපෘතිය | 2019 අයවැය කථාව යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු රජයේ ආයතන නිශ්චිතව දක්වා නොමැති හෙයින්, එය ලබාගෙන ඇත්තේ 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (එන්.බී.ඩී. / NBD) ගොනු කර ඇති තොරතුරු සඳහා වූ ඉල්ලීමක් මගිනි. ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ප්‍රතිචාරයට අනුව, මෙම යෝජනාව සඳහා වගකිවයුතු අමාත්‍යාංශය නගර සැලසුම් විෂය භාර අමාත්‍යාංශය ලෙස හඳුනාගෙන ඇත. එබැවින් තොරතුරු ඉල්ලුම්පත 2020 ජනවාරි 27 දින නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශයට ගොනු කරන ලදී. කෙසේ වෙතත්, මෙම යෝජනාව ඔවුන්ගේ විෂය පථයට අයත් නොවන බව අමාත්‍යාංශය විසින් ප්‍රකාශ කළේය. යෝජනාව සඳහා ක්‍රියාත්මක කරන ආයතනය හඳුනා ගැනීම සඳහා පසුව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම යටතේ තොරතුරු දන ගැනීමේ ඉල්ලීම්පතක් 2020 මැයි 13 වන දින ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ගොනු කරන ලදී. ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ප්‍රතිචාරයෙ සඳහන් වූයේ අදාළ ආයතනය නගර සැලසුම්, උසස් අධ්‍යාපන සහ වාරි මාර්ග කටයුතු අමාත්‍යාංශය බවයි. 2019 දෙසැම්බර් 10 දිනැති 2153/12 අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව පත් කරන ලද නව අමාත්‍ය මණ්ඩලයෙන් පසුව මෙම නමින් තව දුරටත් අමාත්‍යාංශයක් නොමැති බැවින් එම යෝජනාව ක්‍රියාත්මක කරන ආයතනය හඳුනාගත නොහැකි විය. එනිසා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ ඉල්ලීමකින් යෝජනාව පිළිබඳ තොරතුරු ලබා ගත නොහැකි විය. වෙබ් අඩවි පරික්ෂාවෙන්ද කිසිදු තොරතුරක් සොයා ගත නොහැකි විය. | පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමට තොරතුරු නැත. | |
| “ප්‍රජා-ජල අභිමන්” ජල සැපයුම් ක්‍රමය | සීමිත | සැළකිය යුතුයි | නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශය- 8 |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් ලබා දී ඇති "විශාල හා මහ පරිමාණ සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් වල ප්‍රගතිය - 2019 සැප්තැම්බර් 30" මඟින් ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබා ගත්තේය. | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අන්තර්ජාලය හරහා ලබා දී ඇති තොරතුරු අනුව, 2019 සැප්තැම්බර් 30 වන විට ප්‍රගතිය 2019 සඳහා ඉලක්ක කර ඇති ඉලක්කයෙන් 120% ක් විය. සම්පූර්ණ වර්ෂයට අදාළ තොරතුරු නොමැති බැවින්, මෙම තොරතුරු භාවිතා කරමින් ප්‍රගතිය තක්සේරු කර ඇත. | 2019 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 16 න් 8 වන ස්ථානයට නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශය පත්විය. අමාත්‍යාංශයට ලැබුණු බරිත සාමාන්‍ය ලකුණු 61.3 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (වෙන් කළ ප්‍රතිපාදනය මත පදනම්ව බරිත සාමාන්‍යය). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2019 දී ඇගයීමට ලක් කරන ලද අයවැය යෝජනා/ යෝජනා 7 ක් පිළිබඳ තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| "සහසර බස් නවීකරණ" වැඩසටහන | විවෘත | දුර්වලයි | නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශය- 8 |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු වගකිවයුතු අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ ඇති ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනය වෙත ඉදිරිපත් කළ තොරතුරු ඉල්ලුම්පතට ලැබුණු ප්‍රතිචාරයද මාර්ගගත තොරතුරු මූලාශ්‍රය වෙත අපව යොමු කළේය. තවද තොරතුරු නිලධාරියා සමඟ විද්‍යුත් තැපැල් සන්නිවේදනය මගින් වැඩිදුර පැහැදිලි කිරීම් ලබා ගන්නා ලදී. | ප්‍රගති වාර්තාවට අනුව, 2019 දෙසැම්බර් 31 වන දින වන විට 2019 සඳහා ඉලක්ක ගත ප්‍රගතියෙන් 3.7% ක් අත්කරගෙන ඇත. | 2019 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 16 න් 8 වන ස්ථානයට නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශය පත්විය. අමාත්‍යාංශයට ලැබුණු බරිත සාමාන්‍ය ලකුණු 61.3 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (වෙන් කළ ප්‍රතිපාදනය මත පදනම්ව බරිත සාමාන්‍යය). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2019 දී ඇගයීමට ලක් කරන ලද අයවැය යෝජනා/ යෝජනා 7 ක් පිළිබඳ තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට නවීන පහසුකම් හා භාවිතය | උදාසීන | දුර්වලයි | ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යාංශය-1 |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| පහසු බස් රථ 250 ක් අත්කර ගැනීම | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ අදාළ ආයතනය/ වගකිවයුතු රාජ්‍ය ආයතනය වෙත ඉදිරිපත් කළ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් සපයන ලද ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. කෙසේ වෙතත්, ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රගති තොරතුරු ස්ථාවර වාර්තාකරණ රාමුවක් භාවිතා නොකරන අතර පහසුවෙන් සැසඳිය නොහැකි බැවින් තොරතුරු ඇගයීමට සැලකිය යුතු උත්සාහයක් අවශ්‍ය විය. | ලද තොරතුරු අනුව, 2019 දෙසැම්බර් 31 වන දින වන විට 2019 සඳහා ඉලක්ක ගත ප්‍රගතියෙන් 26% ක් අත්කරගෙන ඇත. සපයා ඇති ක්‍රියාකාරී සැලැස්මේ තොරතුරු සහ ප්‍රගති වාර්තාවේ තොරතුරු අතර ගැලපීමක් නොමැත. ප්‍රගති වාර්තාවේ දැක්වෙන්නේ කැබිනට් අනුමැතිය ලැබී ඇති බවට නමුත් අමාත්‍යාංශය තාක්ෂණික ඇගයීම් සිදු කරමින් සිටින අතර ටෙන්ඩරය ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් තවමත් තීරණයක් ගෙන නොමැත. එබැවින්, "CAPC සහ TEC පත් කිරීම" දක්වා වූ සියලු ක්‍රියාකාරකම් පදනම් කරගෙන ප්‍රගතිය තක්සේරු කරන ලදී. ප්‍රගතිය ගණනය කරන ලද්දේ, සම්පූර්ණ කරන ලද ක්‍රියාකාරකම් සඳහා වෙන් කර ඇති සති ගණන, වර්ෂය තුළ සියළුම ක්‍රියාකාරකම් සඳහා ඇස්තමේන්තු කර ඇති මුළු කාලයෙහි ප්‍රතිශතයක් වශයෙනි. | ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යාංශය 2019 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 16 න් 1 වන ස්ථානය ලබා ගත් රාජ්‍ය ආයතන පහෙන් එකකි. අමාත්‍යාංශයට ලැබුණු බරිත සාමාන්‍ය ලකුණු 75 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (වෙන් කළ ප්‍රතිපාදනය මත පදනම්ව බරිත සාමාන්‍යය). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2019 දී ඇගයීමට ලක් කරන ලද එක් අයවැය යෝජනාවක්/ යෝජනාවක් පිළිබඳ තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| | ආවෘත | හෙළිකර නැත | මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය-12 |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| "රන් මාවත්" ග්‍රාමීය පාරවල් නඩත්තු හා ඉදිකිරීමම් වැඩසටහන | මෙම පොරොන්දුවට අදාළ තොරතුරු ලබාගැනීමට වගකිවයුතු රාජ්‍ය ආයතනය වෙත ඉදිරිපත් කළ 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ තොරතුරු ඉල්ලීමට මෙම අදාළ රාජ්‍ය ආයතනය තොරතුරු ලබා නොදුන් අතර මෙම පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමට භාවිත කළ හැකි කිසිදු තොරතුරක් වගකිවයුතු ආයතනයේ වෙබ් අඩවියේ පළකර නැත. | පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමට තොරතුරු නැත. | මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය 2019 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 16 න් අන්තිම ස්ථානයට පත් වූ රාජ්‍ය ආයතන පහෙන් එකකි. අමාත්‍යාංශයට ලැබුණු බරිත සාමාන්‍ය ලකුණු 0 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (වෙන් කළ ප්‍රතිපාදනය මත පදනම්ව බරිත සාමාන්‍යය). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2019 දී ඇගයීමට ලක් කරන ලද එක් වැය යෝජනාවක් පිළිබඳ තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| රාජ්‍ය සේවකයින් සඳහා රු.2,500/- ක | සාධනීය | සම්පූර්ණයි | මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය-1 |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| මාසික අන්තර් දීමනාවක් ලබා දීම | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ අදාළ ආයතනය/ වගකිවයුතු රාජ්‍ය ආයතනය වෙත ඉදිරිපත් කළ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් සපයන ලද ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනිණි. | ලද තොරතුරු අනුව, 2019 දෙසැම්බර් 31 වන දින වන විට 2019 සඳහා ඉලක්ක ගත ප්‍රගතියෙන් 100% ක් අත්කරගෙන ඇත. තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනය වෙත ඉදිරිපත් කළ තොරතුරු ඉල්ලුම්පත සඳහා ලැබුණු ප්‍රතිචාරයෙන් කියැවෙන්නේ මෙම යෝජනාව සඳහා අවශ්‍ය අරමුදල් වෙන් කරන ලද ප්‍රතිපාදනය තුළ කළමනාකරණය කර ඇති අතර රුපියල් බිලියන 2.5 ක අතිරික්ක ඉතිරිකිරීමක් ඉවතට මාරු කර ලද බවයි. එබැවින් මූල්‍ය වියදම් වෙන් කළ ප්‍රමාණයට වඩා අඩු වුවද භෞතික ප්‍රගතිය 100% ක් ලෙස ඇගයීමට ලක් කර ඇත. | මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය, 2019 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 16 න් 1 වන ස්ථානය ලබා ගත් රාජ්‍ය ආයතන පහෙන් එකකි. අමාත්‍යාංශයට ලැබුණු බරිත සාමාන්‍ය ලකුණු 75 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (වෙන් කළ ප්‍රතිපාදනය මත පදනම්ව බරිත සාමාන්‍යය). අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2019 දී ඇගයීමට ලක් කරන ලද වැය යෝජනා/ යෝජනා 5 ක් පිළිබඳ තොරතුරු අනාවරණය කිරීම මත පදනම්ව මෙය ගණනය කරන ලදී. |
| විශ්‍රාම වැටුප් සංශෝධනය | සාධනීය | අතහැර දමා ඇත | නිපුණතා සංවර්ධන, රැකියා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය-1 |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
| --- | --- | --- | --- |
| | මෙම පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ අදාළ ආයතනය/ වගකිවයුතු රාජ්‍ය ආයතනය වෙත ඉදිරිපත් කළ ඉල්ලීම යටතේ ලබා ගැනිණි. | ලද තොරතුරු අනුව, 2019 දෙසැම්බර් 31 දින වන විට මෙම යෝජනාව ක්‍රියාත්මක නොවිය. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 35/2019 (2011.12.10 දිනැති) යෝජනාව ක්‍රියාත්මක කරන බව සඳහන් කරයි. කෙසේ වෙතත්, තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ අමාත්‍යාංශයෙන් ලබා දුන් ප්‍රතිචාරයෙන් සනාථ වන්නේ එය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 35/2019 (I) (2016.01.20 දිනැති) අනුව ක්‍රියාත්මක නොවූ බවයි. | නිපුණතා සංවර්ධන, රැකියා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය 2019 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 16 න් 1 වන ස්ථානය ලබා ගත් රාජ්‍ය ආයතන පහෙන් එකකි. අමාත්‍යාංශයට ලැබුණු බරිත සාමාන්‍ය ලකුණු 75 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (වෙන් කළ ප්‍රතිපාදනය මත පදනම්ව බරිත සාමාන්‍යය). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2019 දී ඇගයීමට ලක් කරන ලද එක් අයවැය යෝජනාවක්/ යෝජනාවක් පිළිබඳ තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| ත්‍රිවිධ හමුදාවේ කොමාන්ඩෝ, නිල ඇඳුම්, ගෙවල් කුලී සහ යහ-පැවැත්ම සඳහා වූ | සීමිත | හෙළිකර නැත | ආරක්ෂක අමාත්‍යාංශය-11 |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| දීමනාව සංශෝධනය කිරීම | 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ඉදිරිපත් කළ තොරතුරු ඉල්ලුම් පත්‍රයට ප්‍රතිචාර ලැබුනේ නාවික හමුදාවෙන් පමණි. ගුවන් හමුදාවෙන් සහ යුධ හමුදාවෙන් ප්‍රතිචාරයක් නොලැබිණි. ලැබුණු තොරතුරු ප්‍රමාණවත් නොවීම හේතුවෙන්, එම තොරතුරු මත පදනම්ව සම්පූර්ණ ප්‍රගතිය තීරණය කිරීමට නොහැකි විය. | පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමට පවතින තොරතුරු ප්‍රමාණවත් නොවේ. | 2019 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 16 න් 11 වන ස්ථානයට ආරක්ෂක අමාත්‍යාංශය පත්විය. අමාත්‍යාංශයට ලැබුණු බරිත සාමාන්‍ය ලකුණු 13.5 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (වෙන් කළ ප්‍රතිපාදනය මත පදනම්ව බරිත සාමාන්‍යය). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2019 දී ඇගයීමට ලක් කරන ලද වැය යෝජනා 2 ක් පිළිබඳ තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| “ග්‍රාමශක්ති” නිෂ්පාදන ගම්මාන වැඩසටහන | ආවෘත | හෙළිකර නැත | ප්‍රජා සවිබලගැන්වීම් සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය-9 |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
